සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

12 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2024 (2025)
தரம் 12 ஆண்டிறுதிப் பரீட்சை - 2024 (2025) Grade 12 Final Term Test - 2024 (2025)

# ආර්ථික විද්‍යාව -1

21 | S | 1 | කාලය / நேரம் / Time } පැය 2

නම / பெயர் / Name } ..........................................
විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ..........................

උපදෙස් :
- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ නම ලියන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත්ම ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.

1. ආර්ථික සංසිද්ධියක් යන්නෙන් අදහස් වනුයේ, පහත ඒවායින් කවරක් ද?
   (1) විචල්‍යයන් අතර සම්බන්ධතාවයක් පැවතීමයි.
   (2) ආර්ථික විචල්‍යයන් අතර අනුලෝම සම්බන්ධතාවයක් පැවතීමයි.
   (3) විචල්‍යයන් අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පැවතීමයි.
   (4) කිසියම් හේතු ඵළයක් මත ආර්ථික විචල්‍යයක හැසිරීමයි.
   (5) ආර්ථික විචල්‍යයන් අනපේක්ෂිත ලෙස වෙනස්වීමයි.

2. පහත දැක්වෙන ප්‍රකාශ අතරින් යථානුරූපී ප්‍රකාශයක් වනුයේ කවර ප්‍රකාශයක් ද?
   (1) වෙළෙඳ පොළ ක්‍රමය තුළ ආදායම් ව්‍යාප්ති විෂමතා පැවතීම, වෙළෙඳ පොළ අසාර්ථක විමකට හේතු නොවේ.
   (2) පාසැල් සිසුන්ට නොමිලයේ ආහාර ලබාදීම රජයේ වගකීමකි.
   (3) දුප්පත් කම අඩු කළ හැක්කේ, සංක්‍රාම ලබාදීමෙන් පමණි.
   (4) මෑත කාලයේ බිත්තර මිල ඉහළ යෑමේ ප්‍රවණතාවයක් පවතී.
   (5) සෑම කුටුම්භයකටම අත්‍යවශ්‍ය ආහාර ලබා දීය යුතුය.

3. ආර්ථිකයක මිල මට්ටම, ගෙවුම් ශේෂය, මුදල් සැපයුම, දළ ජාතික ආදායම වැනි විචල්‍යයන්ගේ හැසිරීම අධ්‍යයනය කරන්නේ,
   (1) සාර්ව ආර්ථික විද්‍යාවයි.
   (2) අභිමතානුරූපී ආර්ථික විද්‍යාවයි.
   (3) සූක්ෂම ආර්ථික විද්‍යාවයි.
   (4) යථානුරූපී ආර්ථික විද්‍යාවයි.
   (5) සමාජ ආර්ථික විද්‍යාවයි.


4. ආර්ථිකයක සම්පත්වල හිඟකමක් හා සම්පත් වල විකල්ප භාවිත හැකියා පවතීනම්, ආර්ථිකයක් තුළ ඒ හා සමගම පැන නැගිය හැකි තත්වයක් ලෙස සැළකිය හැක්කේ,
   (1) ආවස්ථික පිරිවැයකට මුහුණ දීම.
   (2) නිෂ්පාදන ක්‍රියාවලියේ අකාර්යක්ෂමතා ඇතිවීම.
   (3) වැඩිවන ආවස්ථික පිරිවැයක් ඇති වීම.
   (4) පරිභෝජන අවශ්‍යතා මැනවින් ඉටු නොවීම.
   (5) විරැකියා අනුපාතය ඉහළ යාම.



iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

5. 'ආර්ථික සම්පතක්' යන්න ආර්ථික විද්‍යාවට අනුව වඩාත් නිවැරදිව අර්ථ දක්වා ඇත්තේ,
   (1) පෞද්ගලික අංශය විසින් සපයන හිඟ සම්පතක් වශයෙනි.
   (2) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිතා කරන ඕනෑම දෙයක් වශයෙනි..
   (3) ප්‍රතිශ්ඨාපනය කළ නොහැකි සම්පතක් වශයෙනි.
   (4) මිනිස් වුවමනාවන්ට සාපේක්ෂව සැපයුමෙ හිඟකමක් සහිත සම්පත් වශයෙනි.
   (5) මිලක් නියමවී ඇති ස්වාභාවික සම්පතක් වශයෙනි.

6. පහත රූප සටහනෙහි දැක්වෙන නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයෙහි නිෂ්පාදන ලක්ෂ්‍ය A සිට B දක්වා විතැන් වුවහොත්,




   (1) X හා Y භාණ්ඩ දෙකෙහිම නිමැවුම වැඩි වේ.
   (2) X භාණ්ඩයේ ආවස්ථික පිරිවැය වැඩි වේ.
   (3) X නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය අඩු වේ.
   (4) Y භාණ්ඩයේ ආවස්ථික පිරිවැය වැඩි වී X භාණ්ඩයේ ආවස්ථික පිරිවැය අඩු වේ.
   (5) නිෂ්පාදනයේදී ආවස්ථික පිරිවැයක් බිහි නොවේ.

7. පහත සහන් දෑ අතරින් ආර්ථික විද්‍යාවේදී ප්‍රාග්ධන ආයෝජනයක් ලෙස නොසළකන්නේ කවරක් ද?
   (1) පදිංචිය සඳහා නිවසක් ඉදි කිරීම.
   (2) මහා මාර්ග ඉදි කිරීම.
   (3) පෞද්ගලික සමාගමක සාමාන්‍ය කොටස් වල ආයෝජනය කිරීම.
   (4) අමුද්‍රව්‍ය තොග පවත්වා ගැනීම.
   (5) යන්ත්‍රෝපකරණ මිලට ගැනීම.

8. පහත දැක්වෙන දෑ අතුරින් , ආර්ථික පොදු කාර්ය ප්‍රාග්ධනය යටතට ගැනෙන කාණ්ඩය තෝරන්න.
   (1) පානීය ජල සැපයුම් පද්ධති, අප ද්‍රව්‍ය බැහැර කිරීමේ නළ පද්ධති , සන්නිවේදන පහසුකම්.
   (2) ගොඩනැගිළි, කානු පද්ධති, අපද්‍රව්‍ය බැහැර කිරීමේ නළ මාර්ග, පාසැල් ගොඩනැගිළි.
   (3) සන්නිවේදන පහසුකම්, පානීය ජල සැපයුම් පද්ධති, අප ද්‍රව්‍ය බැහැර කිරීමේ නළ පද්ධති.
   (4) ගුවන් තොටුපොළ , වරාය, මහා මාර්ග, සන්නිවේදන පහසුකම්.
   (5) යන්ත්‍රෝපකරණ , වරාය, ගොඩනැගිළි, පානීය ජල පහසුකම් පද්ධති.

9. ශ්‍රම සැපයුම යනු,
   (1) ආර්ථික ප්‍රතිලාභයේ අපේක්ෂාවෙන් පුද්ගලයනන් යොදන කායික හා මානසික වෙහෙසයි.
   (2) නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ පුද්ගලයෙකුගේ ශ්‍රම ඵලදායීතාවයයි.
   (3) ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ඵලදායී ආර්ථික කටයුත්තක පුද්ගලයෙකු යොදන කායික හා මානසික වෙහෙසයි.
   (4) ඵලදායී ආර්ථික කටයුත්තක පුද්ගලයෙකු නිරතවීමට කැමති ශ්‍රම පැය ගණනයි.
   (5) පුද්ගලයෙකු වැඩ කිරීමට කැමති ශ්‍රම පැය ගණනෙහි ඵලදායීතාවයයි.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

10. මූලික ආර්ථික ප්‍රශ්න අතුරින් කා සඳහා නිපදවන්නේ ද යන්න සැළසුම්ගත ආර්ථික පද්ධතියක විසඳනුයේ,

(1) ආණ්ඩුව සැළැස්මක් මගින් භාණ්ඩ හා සේවා මිල ගණන් හා වැටුප් තීරණය කිරීම.


(2) අඩු ආදායම්ලාභි පවුල් සඳහා ප්‍රමුඛතාව ලබාදීම ට රජය මැදිහත්වීම මගිනි.

(3) නිෂ්පාදන සම්පත් වෙළෙඳ පොලේ හුවමාරුව තුළිනි.

(4) ක්‍රය ශක්තිය පහළ හෙලීම සඳහා ඉහළ ආදායම් ලබන අයගෙන් ඉහළ බදු අය කිරීමෙනි.

(5) සාධක හිමියන් හා සාධක ඉල්ලුම් කරුවන් අතර නිදහස් සාධක හුවමාරුවකට ඉඩ හැරීම තුළිනි.

11. වර්තමාන පරිභෝජනය සීමා කිරීමේ හැකියාවක් නොමැති ආර්ථිකයක නිෂ්පාදන හැකියාව වෙනස් වී ඇති ආකාරය පහත දැක්වේ.




ඉහත වෙනස්වීමට අදාළ විය හැකි සාධකය හඳුනාගන්න.

(1) කාර්යක්ෂම අයුරින් සම්පත් උපයෝජනය කිරීම.

(2) සම්පත් උපයෝජනය සමානුපාතිකව ඉහළ යාම.

(3) සම්පත් වල විකල්ප භාවිත හැකියාව වර්ධනය වීම.

(4) විදේශ ප්‍රාග්ධනය ගලා ඒම.

(5) රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව වැඩිවීම.

12. කිසියම් වර්ෂයක් තුළ නිෂ්පාදනයට යොදා ගත් ක්ෂය වූ ප්‍රාග්ධන භාණ්ඩ ප්‍රතිසම්පාදනය මගින් අපේක්ෂා කළ හැක්කේ,

(1) අනාගත පරිභෝජන මට්ටම ඉහළ යාම නිසා පුද්ගල ජීවන තත්ත්වය ඉහළ යාමයි.

(2) ආර්ථිකය තුළ වර්ධනයක් ඇතිවීමයි.

(3) නිෂ්පාදන ධාරිතාව ආරක්ෂා වීමයි.

(4) නිෂ්පාදන ලක්ෂය මායිමේ වක්‍රය දෙසට විතැන් වීමයි.

(5) විභව නිෂ්පාදන ධාරිතාව ප්‍රසාරණය වීමයි.

13. එක්තරා භාණ්ඩයක් සඳහා එක් කුටුම්භයක ඉල්ලුම් මිල ශ්‍රිතය (ප්‍රතිලෝම ඉල්ලුම් ශ්‍රිතය) පහත පරිදි වෙයි. P = 10 - 5Qd මෙම කුටුම්භ හා සමාන කුටුම්භ 20 ක් සිටී නම්, වෙළෙඳ පොළ ඉල්ලුම් ශ්‍රිතය වන්නේ කුමක් ද?

(1) P = 200 5Qd (2) P = 20 - 2Qd (3) Qd = 200 - 50 P

(4) Qd = 40 - 4p (5) Qd = 40 -p

14. X භාණ්ඩය සඳහාඇති ඉල්ලුම් නම්‍යතාවය ශූන්‍ය යැයි සළකන්න.මෙම තත්ත්වය යටතේ X භාණ්ඩයේ සැපයුමෙහි වැඩිවීමක් සිදුවුව හොත් , පහත සඳහන් කවර ප්‍රතිවිපාකයක් හට ගනු ලැබේද ?

(1) නිෂ්පාදන අයභාරය ඉහළ නංවමින් මිල පහළ යයි.

(2) නිෂ්පාදන අයභාරය පහළ නංවමින් මිල පහළ යයි.

(3) X භාණ්ඩයේ අධි සැපයුමක් හට ගනීයි.

(4) X භාණ්ඩයේ අධි ඉල්ලුමක් හට ගනීයි.

(5) මිලෙහි සාපේක්ෂ වශයෙන් අඩුවීමක් හට ගන්නා නමුත් නිෂ්පාදක අයභාරයෙහි වෙනසක් හට නොගනී.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

15. නිෂ්පාදන සාධක සඳහා පවතින ව්‍යුත්පන්න ඉල්ලුම නිසා නිෂ්පාදන සාධක ඉල්ලුම් කිරීමේ දී නිෂ්පාදකයින් සැළකිල්ලට ගත යුතුම කරුණක් ලෙස සැළකිය හැක්කේ,
(1) සාධක සැපයුම් වක්‍ර යේ නම්‍යතාවයයි.
(2) සාධක ඵලදායීතාවයයි.
(3) සාධක හිමිකරුවන් අළෙවි කරන මිලයි.
(4) අනෙකුත් සාධක වල පිරිවැයයි.
(5) නිෂ්පාදන සාධක සුලබතාවයයි.

16. තරඟකාරී මාළු වෙළෙඳ පොළක සමතුලිත මිල ඉහළ යාමට පහත සඳහන් තත්ත්වයන් අතුරින් කවරක් හේතු වේ ද?
(1) ඉල්ලුම් නම්‍යතාවය අපරිමිත වීම සහ ඉන්ධන වල හිගයක් ඇතිවීම.
(2) ඉල්ලුම් නම්‍යතාවය ශුන්‍ය වීම සහ ඉන්ධන පිරිවැය පහළ වැටීම.
(3) ඉල්ලුම් නම්‍යතාවය ඒකීය වීම සහ ධීවරයන්ගේ ශ්‍රම පිරිවැය ඉහළ යාම.
(4) සැපයුම් නම්‍යතාවය අපරිමිත වීම සහ කුකුල් මස් මිල පහළ වැටීම.
(5) සැපයුම් නම්‍යතාවය අපරිමිත වීම සහ කුකුල් මස් මිල ඉහළ යාම.

17. එක්තරා භාණ්ඩයක ඉල්ලුම් සමීකරණය **Qd = 100 - 2p** වන අතර එහි අධි ඉල්ලුම් සමීකරණය **EQd = 70 - 5p** වේ. මීට අනුකූලව මෙම භාණ්ඩයේ සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය පිළිවෙලින්,
(1) රු. 10/= ක් හා ඒකක 76 කි. (2) රු. 14/= ක් හා ඒකක 72 කි.
(3)රු. 18/= ක් හා ඒකක 68 කි. (4) රු. 22/= ක් හා ඒකක 64 කි.
(5)රු. 26/= ක් හා ඒකක 60 කි.

18. Qd = 100 - 5p වන භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය එකට සමාන වනුයේ කවර මිලක දීද ?
(1)රු.10/= දීය. (2) රු. 15 /= දීය. (3) රු.20/= දීය. (4) රු. 25/= දීය (5) රු.50/= දීය.

19. කිසියම් භාණ්ඩයක මිල රු. 20/= දී එහි නම්‍යයතාවය -0.4 කි. නිෂ්පාදන අයභාරය රුපියල් 1000 කි. නිමැවුමේ වෙනසක් සිදු නොකොට අලෙවි ආදායම දෙගුණ කර ගැනීමට මිල කොපමණ ප්‍රතිශතයකින් ඉහළ දැමිය යුතු ද?
(1) 40% (2) 50% (3) 100% (4) 125% (5) 200%

20. එක්තරා භාණ්ඩයක සැපයුම් වක්‍රයට අදාළ සමීකරණය **Qs = -10 + 4p** වේ. භාණ්ඩයේ ඒකකයක මිල රු.10/= ක් වේ නම්, නිෂ්පාදන අතිරික්තය වනුයේ රුපියල්,
(1) 75.50 කි (2) 112.50 කි. (3) 197. 50 කි. (4) 225 .00කි. (5) 300.00 කි.

21. ඉල්ලුම් නීතිය යටතේ අඳිනු ලබන වමේ සිට දකුණට පහළට බැවුම් වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයක් උපකල්පනය කරන්න. මෙම වක්‍රය අනුව භාණ්ඩය සඳහා වන මිල වැඩිවන විට , මිල ඉල්ලුම් නම්‍යතාවයට කුමක් සිදු වේ ද?

(1) ක්‍රමයෙන් අඩු වේ. (2) ක්‍රමයෙන් වැඩි වේ.
(3) වෙනස් නොවේ. (4) ගණනය කළ නොහැක වේ.
(5) බෑවුම මත තීරණය වේ.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

22. පහත ප්‍රකාශ අතුරින් එකඟ වියහැකි ප්‍රකාශය තෝරන්න...
(1) අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී ඕනෑම භාණ්ඩයක සාපේක්ෂ මිල වෙනස් වීමක ආදේශන ප්‍රති විපාක සම්බන්ධතාවය නිශ්චිතවම සෘණ වේ.
(2) අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී සාමාන්‍ය භාණ්ඩයක පමණක් සාපේක්ෂ මිල වෙනස් වීමක ආදේශන ප්‍රති විපාක සම්බන්ධතාවය නිශ්චිතවම සෘණ වේ.
(3) අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී සාමාන්‍ය භාණ්ඩයක සාපේක්ෂ මිල වෙනස් වීමක, මිල ප්‍රතිවිපාකය නිශ්චිතවම ධන වේ.
(4) අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී බාල භාණ්ඩයක සාපේක්ෂ මිල වෙනස් වීමක ආදායම් ප්‍රති විපාක සම්බන්ධතාවය ධන වේ.
(5) ගිෆන් භාණ්ඩයක සාපේක්ෂ මිල වෙනස් වීමක මිල ප්‍රති විපාක සම්බන්ධතාවය නිශ්චිතවම සෘණ වේ.

23. X භාණ්ඩයේ මිල රුපියල් 20/= සිට රුපියල් 18/= දක්වා පහළ වැටෙන විට Y භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය ඒකක 40 සිට 50 දක්වා වැඩි විය. X භාණ්ඩයේ මිලට සාපේක්ෂව Y භාණ්ඩයේ හරස් ඉල්ලුම් නම්‍යතාවය ,
(1) - 0.5 කි. (2) 0.5 කි. (3) 1.5 කි. (4) - 2.5 කි. (5) 2.5 කි.

24. සරල රේඛීය සැපයුම් වක්‍රයක සැපයුම් නම්‍යතාවය සම්බන්ධ පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න

| | සිරස් අන්තඃඛණ්ඩය | මිල සැපයුම් නම්‍යතා සංගුණකය | වක්‍රය දිගේ පහළට ගමන් කරන විට (මිල අඩුවන විට) (ලක්ෂ්‍යයෙන් ලක්ෂ්‍යට) |
|---|---|---|---|
| (1) | ධන | එකට වැඩි | වැඩිවේ. |
| (2) | සෘණ | එකට අඩු | වැඩිවේ. |
| (3) | ධන | එකට අඩු | අඩු වේ. |
| (4) | සෘණ | එකට අඩු | අඩු වේ. |
| (5) | ධන | එකට වැඩි | අඩු වේ. |

25. X හා Y යන භාණ්ඩයන්හි සැපයුම් නම්‍යතාවයන් සමාන වේ. X භාණ්ඩයේ මිල රුපියල් 10/= සිට රුපියල් 8/= දක්වා පහළ බැසීම නිසා X භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණය 20% කින් පහළ බසින ලදී. Y භාණ්ඩයේ මිල 20% කින් පහළ බැසීම නිසා එහි සැපයුම් ප්‍රමාණය ,
(1) 8% කින් අඩු වේ. (2) 10% කින් අඩු වේ. (3) 12% කින් වැඩි වෙයි.
(4) 20% කින් අඩුවෙයි. (5) 20% කින් වැඩි වෙයි.

26. තරඟකාරී වෙළෙඳ පොළක් සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ වලින් ඔබට එකඟවිය නොහැකි ප්‍රකාශය වනුයේ,
(1) සමතුලිත මිලට වඩා අඩු මිලකදී අධි ඉල්ලුම ධන අගයකග් ගනී.
(2) සමතුලිත මිලට වඩා අඩු මිලකදී අධි සැපයුම සෘණ අගයකග් ගනී.
(3) සමතුලිත ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක දී දී අධි ඉල්ලුම් මිල සෘණ අගයක් ගනී.
(4) සමතුලිත ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක දී දී අධි සැපයුම් මිල ධන අගයක් ගනී.
(5) සමතුලිත අවස්ථාවේ අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල ශුන්‍ය අගයක් ගනී.


27. X භාණ්ඩයේ සැපයුම් මිල නම්‍යතාවය 0.5 ක් වන අතර ඉල්ලුම් මිල නම්‍යතාවය -0.3 ක් වේ. මෙම භාණ්ඩය මත රු. 10/= ක බද්දක් පනවන ලදී. එවිට භාණ්ඩයේ මිල ඉහළ යන ප්‍රමාණය රුපියල්.
(1) 2.50 කි. (2) 3.75 කි. (3) 6. 25 කි. (4) 6 කි. (5) 10 කි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

28. නිෂ්පාදන ඒකක බද්දක් පැනවූ විට බද්දෙන් වැඩි ප්‍රමාණයක් නිෂ්පාදකයා විසින් දරණු ලබන අවස්ථාව වන්නේ,
(1) ඒකීය නම්‍ය සැපයුමක දී හා අනම්‍ය ඉල්ලුමක දීය.
(2) නම්‍ය සැපයුමක දී හා අනම්‍ය ඉල්ලුමක දීය.
(3) ඒකීය නම්‍ය ඉල්ලුමක දී හා නම්‍ය සැපයුමක දීය.
(4) ඒකීය නම්‍ය ඉල්ලුම ක දී හා අනම්‍ය සැපයුමක දීය.
(5) ඒකීය නම්‍ය ඉල්ලුමක දී හා ඒකීය නම්‍ය සැපයුමක දීය.

29. නිෂ්පාදන ඒකකයක් මත සහනාධාරයක් ලබාදීමෙන් පසු රූප සටහන පහත දැක්වේ.




සහනාධාරයෙන් පසු පාරිභෝගික අතිරික්තය වන්නේ,
(1)P3 W T (2) P1 S T (3) P2 U T (4) P1 S O (5) P2 N O

30. නිෂ්පාදන සහනාධාරයක මුළු වාසිය පාරිභෝගිකයාට ගලා යන අවස්ථාව වන්නේ,
(1) පූර්ණ අනම්‍ය ඉල්ලුමකදී (2) නම්‍ය සැපයුමක දී
(3)ඒකීය නම්‍ය, ඉල්ලුම් හා සැපයුම තත්වයක දී (4) පූර්ණ අනම්‍ය සැපයුමදී
(5) පූර්ණ නම්‍ය ඉල්ලුමක දී .

31. සාමාන්‍ය ඉල්ලුමක් හා සැපයුමක් පවතින නිෂ්පාදන සාධකයක් සඳහා සඵල අවම මිල පාලනයක් පැනවීම නිසා ඇතිවන ප්‍රතිවිපාක වන්නේ,
(1) සේවා නියුක්ති මට්ටම ඉහළ යාම
(2) සේවා වියුක්ති මට්ටම පහළ යාම
(3) සේවා වියුක්ති මට්ටම ඉහළ යාම
(4) සමාජ සුභ සාධන අවාසියක් හට නොගැනීම.
(5) පූර්ණ සේවා නියුක්ති මට්ටමට ළඟාවේ.

32. අවම මිල නියම කිරීමත් සමග ඇතිවන අධි සැපයුම රජය විසින් මිල දී ගැනීමට තීරණය කළහොත් ,
(1) වෙළෙඳ පොළ මිල පහත වැටේ.
(2) නිෂ්පාදන අතිරික්තය අඩුවීම.
(3) පාරිභෝගික අතිරික්තය අඩුවේ.
(4) වෙළෙඳ පොළ ඉල්ලුම වැඩිවේ.
(5) සමාජ සුභ සාධන අවාසියක් හට නොගනී.

33. රජය මැදිහත් වී උපරිම මිල පාලනයක් පමණක් පනවා ක්‍රියා කිරීමේ ප්‍රතිවිපාකයක් වන්නේ,
(1) සැපයුම වැඩිවීම. (2) ඉල්ලුම අඩුවීම.
(3) වෙළෙඳ පොළ තුළ අයි සැපයුමක් ඇතිවීම. (4) කළුකඩ මිලක් බිහිවීම.
(5) අයි සැපයුම් මිලක් ඇතිවීම.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

34. කෘෂිකාර්මික භාණ්ඩ වල නිරන්තරයෙන් මිල වෙනස්වීම් සිදු වන්නේ කුමන තත්වයක් පවතින විට ද?
(1) අනම්‍ය ඉල්ලුමක්
(2) නම්‍ය සැපයුමක්
(3) නම්‍ය ඉල්ලුමක් හා නම්‍ය සැපයුමක්
(4) අනම්‍ය ඉල්ලුමක් හා අනම්‍ය සැපයුමක්
(5) නම්‍ය ඉල්ලුමක් හා අනම්‍ය සැපයුමක්

35. කෙටි කාලීන මුළු ස්ථාවර පිරිවැය යන්නට ඇතුළත් නොවන්නේ,
(1)බලපත්‍ර ගාස්තු (2) නුපුහුණු ශ්‍රමිකයනට ගෙවනු ලබන වැටුප්
(3)රක්ෂණ වාරික (4) ප්‍රාග්ධනය සඳහා පොලී ගෙවීම්.
(5) කළමණාකරුවන්ට ගෙවන වැටුප්.

36. නිෂ්පාදන කටයුත්තක ආරෝපිත පිරිවැයක් නොපවතීනම්,
(1) ආර්ථික ලාභ ශූන්‍ය වේ.
(2) අවප්‍රාමාණික ලාභ ලබා ගැනීමට සිදු වේ.
(3) ගිණුම්කරණ ලාභය ආර්ථික ලාභයට සමාන වේ.
(4) නිෂ්පාදකයා නිෂ්පාදන කටයුතු වලින් ඉවත් වේ.
(5) ආර්ථික ලාභ පහත වැටේ.


37. පහත සඳහන් ප්‍රකාශ වලින් නිවැරදි ප්‍රකාශය හඳුනාගන්න.
(1) ආන්තික පිරිවැය යනු, මුළු විචල්‍ය පිරිවැය වක්‍රයේ බෑවුමයි.
(2) ආන්තික පිරිවැය යනු, අවසාන ඒකකයේ පිරිවැයයි.
(3) දිගු කාලයේ දී හීනවන ආන්තික ඵලදායිතා නීතිය ක්‍රියාත්මක වේ.
(4) ස්ථාවර පිරිවැය දිගු කාලයේදීද පවතී.
(5) ආන්තික ඵලදාව හා ආන්තික අයභාර ඵලදාව යන්න සමාන සංකල්පයන් වේ.

38. අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා පහළ මිල ගණන් වලදී පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක සැපයුම් වක්‍රය,
(1) අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට ඉහළින් පවතින ආන්තික පිරිවැය වක්‍රයයි.
(2) නිමැවුම අක්ෂයට සමාන්තරව ගමන් කරන තිරස් රේඛාවකි.
(3) නිමැවුම ශූන්‍ය වන අතර මිල අක්ෂයට සමාන වේ.
(4) සමස්ත ආන්තික පිරිවැය වක්‍රයයි.
(5) අවම සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයට ඉහළින් පිහිටන ආන්තික පිරිවැය වක්‍රයයි.


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

39. පහත රූප සටහනට නුව පූර්ණ තරගකාරී වෙළෙඳ පොළක කටයුතු කරන ආයතනයක මිල රු 20/ = දී සමතුලිතව පවතින ආකාරය පෙන්වයි.ආයතනය සම්බන්ධයෙන් කවර සංයෝජනයක් නිවරදි වේ ද?

•




| | මුළු ස්ථාවර පිරිවැය | ආයතනයේ නිෂ්පාදන අතිරික්තය රු. | ආර්ථික ලාභය රුපියල් |
|---|---|---|---|
| (1) | 1600 | 800 | 800 |
| (2) | 800 | 800 | 800 |
| (3) | 1600 | 2000 | 1200 |
| (4) | 1600 | 2000 | 1600 |
| (5) | 800 | 1600 | 800 |

40. නිමැවුම ඒකක 20 දී සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC ) රු.15/= කි. මුළු පිරිවැය (TC) රු.500/= කි. නිමැවුම ඒකක 40 දක්වා වැඩි කිරීමේ දී ආන්තික පිරිවැය (MC) රු.10/= කි. ඒකක 40ක් නිපද වන විට සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) වනු යේ,

(1) රු. 10/= කි (2) රු. 12.50 කි. (3) රු. 15/= කි. (4) රු.17.50 කි. (5) රු.20/=කි.

41. පූර්ණ තරගය, ඒකාධිකාරය, ඒකාධිකාරී තරගය, සහ කතිපයාධිකාරය යන වෙළෙඳ පොළ තත්ත්වයනට අදාළ උදාහරණ ශ්‍රී ලංකාව ඇසුරින් අනුපිළිවෙලින් දැක්වෙන ප්‍රකාශය කවරේ ද?

(1) පුවත් පත් සමාගම්, බාබර් සාප්පු , වී ගොවිතැන, ඉන්ධන සමාගම්.
(2) වී ගොවිතැන, තැපැල් සේවා, ආපන ශාලා, ඉන්ධන සමාගම්.
(3) සිල්ලර වෙළෙ සැල්, ගෑස් සමාගම් , බාබර් සාප්පු, ආපන ශාලා
(4) ආපන ශාලා, දුම්රිය සේවා, වී ගොවිතැන, වානිජ බැංකු.
(5) වී ගොවිතැන, ගෑස් සමාගම්,බාබර් සාප්පු, ආපන ශාලා .

42. වෙළෙඳ පොළ ප්‍ර වේශය අබාධ හා දිගු කාලයේ ප්‍රමාණික ලාභ පමණක් ලබන ආයතන පවතින වෙළෙඳ පොළ ව්‍යුහයන් නම්,

(1) පූර්ණ තරගකාරී හා ඒකාධිකාරී තරග වෙළෙඳ පොළ
(2) ඒකාධිකාරී තරග හා කතිපායාධිකාරී වෙළෙඳ පොළ
(3) පූර්ණ තරගකාරී හා කතිපයාධිකාරී වෙළෙඳ පොළ
(4) එකාධිකාරී හා කතිපයාධිකාරී. වෙළෙඳ පොළ
(5) ඒකාධිකාරී තරග හා ඒකාධිකාරී වෙළෙඳ පොළ

43. පූර්ණ තරගකාරී ආයතනයක් ආර්ථික අලාභ ලබන තත්ත්වයක දී පමණක් දැකිය හැක්කේ,

(1) ආන්තික පිරිවැය , ආන්තික අයභාරයට සමාන වන විටදීය.
(2) මිල , සාමාන්‍ය මුළු පිරිවැයට වඩා අඩුවන අවස්ථාවේදීය.
(3) මිල , සාමාන්‍ය මුළු පිරිවැයට වඩා වැඩිවන අවස්ථාවේදීය.
(4) මිල , සාමාන්‍ය මුළු පිරිවැයට සමාන වන අවස්ථාවේදීය.
(5) ඉල්ලුම් වක්‍රය ප්‍රමාණ අක්ෂයට සමාන්තර වන විටදීය.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

44. පරිමාණානුකූල පිරිමැසුම්,
   (1) සෑම විටම නිෂ්ප්‍රාමාණික ලාභ වැඩිවීමට හේතු වේ.
   (2) සමාන්‍ය පිරිවැය වැඩිවීමට හේතු වේ.
   (3) බහු ජාතික සමාගම් වලට ප්‍රතිලාභ ගෙනදීමට හේතු වේ.
   (4) දිගු කාලීන සාමාන්‍ය පිරිවැය පහළ වැටීමට හේතු වේ.
   (5) නිමැවුම සමානුපාතිකව වැඩිවීමට හේතු වේ.

45. පරිමාණානුකූල ඵල නීතිය යනුවෙන් අදහස් වන්නේ,
   (1) දිගු කාලයේ දී විචල්‍ය පිරිවැය මත ස්ථාවර පිරිවැය වෙනස්කර ගෙන යාමේ දී හට ගන්නා පිරිමැසුම් වේ.
   (2) කෙටි කාලයේ දී සියළුම සාධක විචල්‍ය සාධක බවට පත්වී ඵලදාව වැඩිවන තත්ත්වයකට පත් වීමත් හට ගන්නා පිරිමැසුම් වේ.
   (3) වැඩිවන , අඩුවන හා ස්ථාවර ආන්තික ඵලදාවක් ඇතිවීම වේ.
   (4) යෙදවුම්අතිරේක ඒකකයකින් වැඩි කරන විට, මුළු ඵලදාවේ සිදුවන ඉහළ යාම වේ.
   (5) සියළුම සාධක වෙනස් කරමින් නිෂ්පාදනය සිදු කරන විට, නිෂ්පාදනය හැසිරෙන ආකාරය වේ.

46. ආර්ථිකයක සැබෑ නිමැවුම , විභව නිමැවුමට සමාන වන තත්ත්වය හඳුන්වන්නේ,
   (1) ආර්ථික පසු බැසීම  (2) පූර්ණ සේවා නියුක්තිය.
   (3)ආර්ථික ප්‍රසාරණය.  (4) උද්ධමනීය නිමැවුම් පරතරය.
   (5) අවධමනීය නිමැවුම් පරතරය

47. රටක දළ දේශීය ආදායම හා ශුද්ධ ජාතික ආදායම අතර වෙනස වන්නේ,
   (1) ශුද්ධ වක්‍ර බදු හා ශුද්ධ ප්‍රාථමික ආදායම
   (2) ප්‍රාග්ධන පරිභෝජන වියදම හා ශුද්ධ ද්විතීක ආදායම
   (3) ශුද්ධ වක්‍ර බදු හා ප්‍රාථමික යෙදවුම්.
   (4) ප්‍රාග්ධන පරිභෝජන වියදම හා විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම
   (5) ශුද්ධ වක්‍ර බදු හා නිෂ්පාදිත බදු

48. වැය කළ හැකි දළ ජාතික ආදායමින්, මුළු පරිභෝජන වියදම අඩු කළ විට ලැබෙන වටිනාකම
   (1) දේශීය ඉතුරුම් වේ.  (2) විදේශ ඉතුරුම් වේ.
   (3)ජාතික ඉතුරුම් වේ.  (4) දළ ආයෝජනය වේ.  (5) ආයෝජන පරතරය වේ.

49. ආන්තික පරිභෝජන නැඹියාව,0. 8ක් වන ආර්ථිකයක ස්ථාවර බදු මිලියන 10 ක් වැඩි කළ විට සමතුලිත නිමැවුමේ සිදුවන සංකෝචනාත්මක බලපෑම රු. මිලියන ,
   (1) 8 කි.  (20 12.5 කි.  (3) 9.2 කි.  (4) 30 කි.  (5) 40 කි.

50. සරල ආර්ථිකයක වියදම් ගුණකය 5 ක් වේ නම්, එහි ආන්තික පරිභෝජන නැඹියාව වන්නේ,
   (1) 0.2 කි.  (2) 0.5 කි.  (3) 0. 8 කි.  (4) 0.9 කි.  (5) 1. 5 කි.

☸☸☸



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

12 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2024 (2025)
தரம் 12 ஆண்டிறுதிப் பரீட்சை - 2024 (2025) Grade 12 Final Term Test - 2024 (2025)

| ආර්ථික විද්‍යාව | 21 | S | 11 | කාලය / நேரம் / Time } පැය 3 |
|---|---|---|---|---|

නම / பெயர் / Name } ..................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ..............................

**අමතර මිනිත්තු 10 ක කාලයක් ලැබෙන අතර එය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොද වන්න.**

- **" අ" උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද , " ආ" උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**
- **අවශ්‍ය විටක ප්‍රස්ථාර කඩදාසි භාවිතා කරන්න.**

"අ" කොටස

(1) I "ආර්ථික විද්‍යාව ඉගෙනීම ඕනෑම පුද්ගලයෙකුට වැදගත් වේ." ආර්ථික විද්‍යාව ඉගෙනීමේ වැදගත් කම් මොනවාද? (ලකුණු 04 යි)

II "හිගකම සෑම ආර්ථිකයකටම බලපාන කේන්ද්‍රීය ගැටලුවකි" හිගකම නිර්වචනය කර එය සෑම ආර්ථිකයකටම බලපාන්නේ කවර හේතු නිසාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

III තේරීමකදී ආවස්ථික පිරිවැයක් ඇති විය හැකි වුවද ආවස්ථික පිරිවැය ශූන්‍ය විය හැකි අවස්ථාද පවතී .ඒ මොනවාද? (ලකුණු 03යි)

IV ව්‍යවසායකයා කළමනාකරුගෙන් වෙනස් වේ. ව්‍යවසායකයා හා කළමනාකරු අතර වෙනස් කම් මොනවාද? (ලකුණු 04 යි)

V නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇඳීමේදී භාවිතා කරන උපකල්පන 2 ක් නම් කර පහත දැක්වෙන අවස්ථා සඳහා සුදුසු නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර අඳින්න.

අ) කෘෂි නිෂ්පාදන සඳහා ලබා දෙන පොහොර සහනාධාරය වැඩි කිරීම.
ආ) රාජ්‍ය අංශයේ රැකියා කරන්නන් බොහෝ පිරිසක් විදේශ සේවය සඳහා පිටත්ව යාම
(ලකුණු 04 යි)

(2) I පහත සංකල්ප පැහැදිලි කරන්න.

අ) ආර්ථික සම්පත්
ආ) ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් (ලකුණු 2 x 2=4 යි)

II "නූතන ආර්ථිකයින්හි රාජ්‍ය නොවන සංවිධාන විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි.රාජ්‍ය නොවන සංවිධාන ආර්ථිකයක් තුළ ඉටු කරන කාර්යයන් 4 ක් සඳහන් කරන්න. (ලකුණු 4 යි)

III වෙළඳපොළ ආර්ථිකයක ලාභය මගින් ඉටු කරන කාර්යයන් මොනවාද? (ලකුණු 4 යි)

IV ආර්ථික පද්ධතියක කාර්යසාධනය ඇගයීම සඳහා යොදා ගන්නා නිර්ණායක මොනවාද? (ලකුණු 4 යි)

V "වර්තමාන පරිභෝජනය කැප කළහොත් අනාගතයේ ආර්ථික වෘද්ධියක් කරා ළගා විය හැකිය" මෙම ප්‍රකාශය සමග ඔබ එකග වන්නේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 4 යි)



iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

(3) I ඉල්ලුම් න්‍යාය ඉල්ලුම් නීතිය ද ඇතුළත් පුළුල් සංකල්පයකි. පැහැදිළි කරන්න. ( ලකුණු 04)

II බාල භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය ඍණ බෑවුමක් ගනු ලැබුවත් ගිෆන් භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය ධන බෑවුමක් ගනු ලබන්නේ ඇයි ද යන්න මිල අඩු වීමක් මුල් කොට ගෙන පැහැදිළි කරන්න.

( ලකුණු 04)

III සැපයුම් නීතිය අනුව සළකා බලන භාණ්ඩයේ මිල වැඩිවන විට සැපයුම් ප්‍රමාණය වැඩි වීමට හේතුව පැහැදිළි කරන්න. ( ලකුණු 04)

IV තරඟකාරී වෙළෙඳ පොළ සමතුලිතයේ දී පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදක අතිරික්තයන් නිර්වචනය කරන්න. ( ලකුණු 04)

V ඉල්ලුම් හා සැපයුම් වක්‍ර දෙකම එකවර වෙනස් වන බව සිතන්න. සමතුලිත මිල ඉහළ ගිය ද සමතුලිත ප්‍රමාණය වෙනස් නොවන්නේ, කුමන තත්ත්වයක දීද ? එම තත්ත්වය රූප සටහනක දක්වන්න.

( ලකුණු 04)

(4) (අ) තරඟකාරී වෙළෙඳ පොළක අළෙවි වන එක්තරා භාණ්ඩයක් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ. මිල රුපියල් වලිනි.

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 4 | 10 | 2 |
| 6 | 8 | 4 |

I සමතුලිත මිල වීජ ගණිතමය ලෙස සමීකරණ ඇසුරින් ගණනය කොට ප්‍රස්ථාර සටහනක පෙන්වන්න. ( ලකුණු 04)

II සමතුලිත මිලේ දී ඉල්ලුම් නම්‍යතාවය හා පාරිභෝගික පැහැදම ගණනය කරන්න.

( ලකුණු 02)

(ආ) I භාණ්ඩයක මිල වෙනස් වන විට, සැපයුම් කරුවන් දක්වන ප්‍රතිචාරය භාණ්ඩයකින් භාණ්ඩයකට වෙනස් වීමට බලපාන හේතු තුනක් දක්වන්න. ( ලකුණු 03)

II බාල භාණ්ඩ, අත්‍යවශ්‍ය භාණ්ඩ හා සුඛෝපභෝගී භාණ්ඩ, ආදායම් ඉල්ලුම් නම්‍යතාවය ඇසුරින් පැහැදිළි කරන්න. ( ලකුණු 03)

III පහත සඳහන් සිදුවීම් තරඟකාරී මාළු වෙළෙඳ පොළක සමතුලිතය කෙරෙහි බලපාන ආකාර රූප සටහන් ඇසුරින් පැහැදිළි කරන්න.

(A ) රජය ධීවරයන්ට ලීටරයකට රුපියල් 25/= ක මාසික ඉන්ධන සහනාධාරයක් ලබා දීම.

(B) මාළු පරිභෝජනය සෞඛ්‍යයට ඉතා හිතකර බව පාරිභෝගිකයින් පිළිගැනීමත් සමග පාරිභෝගික සංඛ්‍යාව ඉහළ යාම.

(C) බිත්තර මිල අඩුවීම.

(D) කාල ගුණය අයහපත් වීම හේතු කොට ගෙන ඉදිරි දින කීපය තුළ මාළු මිල වැඩි වේයැයි ගැණුම් කරුවන් හා විකුණුම් කරුවන් අපේක්ෂා කිරීම.

(ලකුණු 2 x4 = 8 කි.)

(5) I වෙළෙඳ පොළට රජය මැදිහත් වන අවස්ථා කවරේ ද? ( ලකුණු 04)

II පරිභෝජන බද්දක් හා නිෂ්පාදන බද්දක් අතර වෙනස රූප සටහන් මගින් පහැදිළි කරන්න. ( ලකුණු 04)

III පහත දැක්වෙන්නේ එක්තරා භාණ්ඩයකට අදාළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ වේ.

$Qd = 500 - 10p$ $\qquad$ $Qs = -100 + 10p$

රජය මෙම භාණ්ඩය සඳහා රු. 10/= ක සහනාධාරයක් ලබා දෙන ලදී. ප්‍රස්ථාර සටහනක් ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(අ) සහනාධාරයෙන් පසු වෙළෙඳ පොළ සමතුලිතය ගණනය කරන්න. ( ලකුණු 02)
(ආ) සහනාධාරය සඳහා රජය දරණ පිරිවැය කොපමණ ද? ( ලකුණු 02)
(ඉ) සහනාධාරයෙන් පසු නිෂ්පාදක අතිරික්තය හා පාරිභෝගික අතිරික්තය ගණනය කරන්න. ( ලකුණු 02)
(ඊ) මේ නිසා ඇතිවන ශුභ සාධන අවාසිය ගණනය කරන්න. ( ලකුණු 02)

IV සහනාධාරයක් ලබා දීම නිසා සමාජ සුභ සාධන අවාසියක් ඇති වන්නේ ඇයි?

( ලකුණු 04)

(6) I අවම මිල පාලනය සාර්ථක කර ගැනීම සඳහා රජයකට ගත හැකි ක්‍රියා මාර්ග මොනවා ද?
( ලකුණු 04)

II කිසියම් භාණ්ඩයක් මත රජය අවම මිලක් පනවා එහි දී ඇතිවන සමස්ථ සැපයුම පාරිභෝගිකයන් ඉල්ලනු ලබන මිලකට අලෙවි කරන ලෙසත්, අවම මිල හා ඉල්ලුම් මිල අතර වෙනස රජය ඌණ පූරණය කිරීමේ මිල ආධාරක ක්‍රම වේදයක් ක්‍රියාත්මක කරන බවත් දැණුම් දෙන ලදී. සුදුසු රූප සටහනක් මගින් රජය ඌණ පූරණය කිරීම සඳහා දරණ වියදම පෙන්නුම් කරන්න.

( ලකුණු 04)

III එක්තරා භාණ්ඩයකට අදාළ ඉල්ලුම් හා සැපයුම් ලේඛනයන් පහතදැක්වේ.

| මිල | ඉල්ලුම | සැපයුම |
|---|---|---|
| 10 | 150 | 0 |
| 35 | 25 | 125 |

මෙම භාණ්ඩය මත රජය රු. 20/= ක උපරිම මිලක් නියම කරන ලදී. ඒ අනුව අදාළ ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(අ) උපරිම මිල නිසා ඇතිවන කළු කඩ මිල කොපමණ ද? ( ලකුණු 02)
(ආ) කළු කඩ මිල ඇතිවූ පසු පාරිභෝගික අතිරික්තය කොපමණ ද? ( ලකුණු 02)
(ඉ) උපරිම මිලෙන් පසු නිෂ්පාදන අතරික්තය ගණනය කරන්න. ( ලකුණු 02)
(ඊ) උපරිම මිල රු. 30/= ක් විය නොහැකි ද? පිළිතුර පැහැදිළි කරන්න. ( ලකුණු 02)

IV කෘෂි භාණ්ඩ වල මිල ස්ථාවර කිරීමට ගත හැකි පියවර කවරේ ද? ( ලකුණු 04)

## "ආ" කොටස

(7) I වෙළෙඳ පොළ ව්‍යුහයන් නම් කරන්න. ( ලකුණු 04)

II නිෂ්පාදන ආයතනයක කෙටි කාලීන පිරිවැය වක්‍රවල හැඩය සමග හීනවන ඵල නීතිය සම්බන්ධ වන්නේ කෙසේ දැයි පැහැදිළි කරන්න. ( ලකුණු 04)

III පූර්ණ තරඟකාරී වෙළෙඳ පොළ ව්‍යුහයන් සහ ඒකාධිකාරී තරඟ වෙළෙඳ පොළ ව්‍යුහයන් අතර දක්නට ලැබෙන වෙනස්කම් සඳහන් කරන්න. ( ලකුණු 04)

IV නිෂ්ප්‍රාමාණික ලාභය සහ ප්‍රාමාණික ලාභය අතර වෙනස දක්වන්න. ( ලකුණු 04)
V සංක්‍රාම ඉපයුම් හා ආර්ථික බදු කුලිය යන්න නිර්වචනය කොට , එය ප්‍රස්ථාර සටහනක් ඇසුරින් පැහැදිළි කරන්න. ( ලකුණු 04)

(8) I නිෂ්පාදන ශ්‍රිතය හඳුන්වා නිෂ්පාදනයෙහි කෙටි කාලය යන්න පැහැදිළි කරන්න. ( ලකුණු 03)
II පහත සඳහන් සංරචකයන් හඳුන්වා දෙන්න.
(අ) මුළු ඵලදාව. (TP) (ආ) සාමාන්‍ය ඵලදාව (AP) (ඉ) ආන්තික ඵලදාව (MP)
( ලකුණු 03)
III පරිමාණානුකූල පිරිමැසුම් හට ගැනීමට බලපාන හේතු සාධක නම් කරන්න. ( ලකුණු 04)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

IV පහත දැක්වෙන්නේ මාසයක් තුළ වළං නිපද වන ආයතනයක අයභාර හා පිරිවැය තත්ත්වයන්ය.

| | |
|---|---|
| නිමැවුම ඒකක | 5000 |
| මිල රු. | 50 |
| ශ්‍රම පිරිවැය | 80000 |
| ප්‍රාමාණික ලාභය | 20000 |
| ණය සඳහා පොලී | 5000 |
| ප්‍රවාහන ගාස්තු | 8000 |
| ආයතනය සතු ඉඩමෙහි අහිමි බදු කුලිය | 15000 |
| ආර්ථික ක්ෂයවීම් | 6000 |
| ගොඩනැගිලි කුලී | 12000 |
| ආයතනය සතු මුදල්වූ වල අහිමි වූ පොලී | 4000 |
| අමු ද්‍රව්‍ය මිලට ගැනීම් | 30000 |

(අ) ගණකාධිකාරී ලාභය හා ආර්ථික ලාභය ගණනය කරන්න. ( ලකුණු 2 X 5 = 10)

(9) I විභව නිමැවුම හා නිමැවුම් පරතරය යන සංකල්ප පැහැදිළි කරන්න. ( ලකුණු 03)

II ජාතික ගිණුම්කරණයේ දී භාවිතා වන පහත සඳහන් මිල ප්‍රභේද හඳුන්වන්න.

(අ) මූලික මිල.

(ආ) නිෂ්පාදකයාගේ මිල.

(ඉ) ගැණුම්කරුගේ මිල ( ලකුණු 2x 3= 06)

III දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් නොවන ඵලදායී කටයුතු ලෙස හඳුන්වන්නේ මොනවා ද? ( ලකුණු 04)

IV කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(සියළු දත්ත රු. මිලියන වලිනි.)

| | |
|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය (වෙළෙඳ මිලට) | 5000 |
| ප්‍රාග්ධන ක්ෂය | 500 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම | -300 |
| සමස්ථ පරිභෝජනය | 2000 |
| ශුද්ධ වක්‍රබදු | 200 |
| ශුද්ධ අපනයන | - 400 |
| විදේශ ශුද්ධ ද්විතීක ආදායම් | 400 |

ඉහත තොරතුරු ඇසුරින් පහත දෑ ගණනය කරන්න.

(අ) ශුද්ධ දේශීය ආදායම. (ආ) දළ දේශීය වියදම.

(ඉ) දළ ආයෝජනය (ඊ) ජාතික ඉතුරුම් ( ලකුණු 2 X 4 = 8)

(10) I ආර්ථිකයක පෞද්ගලික පරිභෝජන ශ්‍රිතය දක්වා , එය පැහැදිළි කරන්න . ( ලකුණු 04)

II පරිභෝජන ශ්‍රිතය තුලින් ඉතුරුම් ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න. ( ලකුණු 04)

III රජය ආර්ථිකයට මැදිහත්ව රාජ්‍ය මිල දී ගැනීම් සිදුකරන නිසා ආර්ථිකයේ ද්විතික ආදායම් ප්‍රසාරණයක් සිදු වේ. මෙය පැහැදිළි කරන්න. ( ලකුණු 04)

IV සරල ආර්ථිකයක ස්වායක්ත පරිභෝජන වියදම රු. මිලියන 100 ක් වන අතර වැඩිවන සෑම රුපියලකින්ම ශත 75 ක් පරිභෝජනය සඳහා යොදවයි. ආයෝජනය මිලියන 50 ක් වේ නම්, මෙහි සමතුලිත නිමැවුම ගණනය කරන්න. ( ලකුණු 04)

V රාජ්‍ය වියදම් ගුණකයේ හා වියදම් ගුණකයේ වටිනාකම අතර වෙනස 1 ට සමාන වන්නේ ඇයිද යන්න පැහැදිළි කරන්න. ( ලකුණු 04)

❁❁❁



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub